සබරගමුව පළාත් සභාව - சப்ரகமுவ மாகாண சபை - Sabaragamuwa Provincial Council

අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

கல்வி தகவல் தொழில் நுட்பம் மற்றும் கலாச்சார நடவடிக்கைகளுக்கான அமைச்சு

Ministry of Education, Information Technology & Cultural Affairs

Email – edusabaram@gmail.com www.moe.sg.gov.lk

PMoE Sabaragamuwa

අමාත්‍යාංශ ලේකම් / Secretary – Office – 045 2223015 Residence – 045 2232985

කාර්යාලය / Office – නවනගරය,රත්නපුර. Newtown, Rathnapura. Office - 045 2222542 Fax - 045 2228042

මගේ අංකය / எனது இல / ආල ෙර-ආඩ්‍යජ: ME/E/2(සබර/චක්‍රලේඛ)

ඔබේ අංකය / உமது இல / Your Number:

දිනය / திகதி / Date: 2022.04.01

පළාත් අධ්‍යාපන චක්‍රලේඛ අංක : සබර/2022/02

සබරගමුව පළාත් සභා පාසල් වල සියළුම විදුහල්පතිවරුන් වෙත,

**<u>පාසල් තුල බාහිර ක්‍රියාකාරකම් සඳහා අවසර ලබාදීම.</u>**

රජයේ පාසල් තුළ අධ්‍යාපනික කටයුතු හා ඊට අදාළ බාහිර ක්‍රියාකාරකම් රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශය, පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය,පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාලයේ අධීක්ෂණය යටතේ සිදු විය යුතු වේ.

02. එසේ වුවද පාසල් ක්‍රීඩා පිටි හා පාසල් සතු දේපල අධ්‍යාපන කාර්යයන් වලට පරිබාහිරව වෙනත් කාර්යයන් සඳහා බාහිර පාර්ශවයන් යොදා ගැනීම හේතුවෙන් පාසල් සම්පත් විනාශ කිරීම, හානි කිරීම, අවභාවිත කිරීම වැනි ගැටළු වලට මුහුණ දීමට සිදුවන අතර ඒවා නැවත යථා තත්වයට පත් කිරීම සඳහා රාජ්‍ය අරමුදල් වැය කිරීමට සිදු වේ.එබැවින් අධ්‍යාපන කාර්යයන් වලින් පරිබාහිර කාර්යයන් සඳහා පාසල් ගොඩනැගිලි, ක්‍රීඩා පිටි යොදා ගැනීම හැකිතාක් අවම කිරීමට විදුහල්පතිවරුන් වග බලාගත යුතුය.

03. පාසල් ශිෂ්‍ය ප්‍රජාවට සෘජුවම සම්බන්ධ ආයතන එනම් පාසල් සංවර්ධන සමිති, ආදි ශිෂ්‍ය සංගම් මගින් කරනු ලබන ඉල්ලීම් සුවිශේෂී කාර්යයන් ලෙස සලකා ඒ සඳහා අවසර ලබා දිය යුතුය. එසේම අධ්‍යාපන කාර්යයන්ට සෘජුවම සම්බන්ධ නොමැති ආයතන හා පුද්ගලයින් විසින් පාසල්වල ක්‍රියාත්මක කරන වෙනත් පොදු කාර්යයන් සඳහා පාසල සතු සම්පත් යොදා ගැනීමේදී පහත පරිදි ක්‍රියා කළ යුතුය.

I.. භාවිත කිරීමට අපේක්ෂා කරනු ලබන ගොඩනැගිල්ලේ හෝ ක්‍රීඩා පිටියේ ප්‍රමාණය, සපයා දියහැකි පහසුකම් ආදිය සලකා බලා පාසල් සංවර්ධන සමිතියේ ගිණුමට බැර වන පරිදි මුදලක් විදුහල්පති විසින් තීරණය කිරීම.මෙහිදී අවම ගාස්තුව රු.5000/- විය යුතු අතර රිසිට්පතක් නිකුත් කළ යුතුය.

II. මෙයට අමතරව අදාළ කාර්යය නිම වීමෙන් පසුව යම් අලාභයක් සිදු වුවහොත් එය පියවා ගැනීමට හැකි වන පරිදි ආපසු ගෙවන තැම්පතුවක් ලෙස රු. 25,000/- ක මුදලක් පාසල් සංවර්ධන ගිණුමට බැර කල යුතු අතර ඒ සඳහා ද රිසිට්පතක් නිකුත් කළ යුතුය. අදාළ කාර්යය අවසන් වීමෙන් පසුව හානි පාඩු ගණනය කර ගෙවිය යුතු මුදල ආපසු ගෙවිය යුතු අතර අයවීම් ඇතොත් ඒවා අයකර ගැනීම කළ යුතුය

04. එක් දිනක් සඳහා ඉහත සඳහන් පරිදි කටයුතු කිරීම සඳහා විදුහල්පති වෙත බලය පවරන අතර දින දෙකක් හෝ ඊට වැඩි නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙතින් අවසර ලබා ගෙන විදුහල්පති විසින් ඉහත පරිදි කටයුතු කළ යුතුය.

06. මේ සම්බන්ධව කරන ගනුදෙනු සම්බන්ධව වෙනම ලේඛනයක් පාසල තුල පවත්වාගෙන යා යුතු අතර මෙම කරුණු කෙරෙහි සැලකිලිමත් නොවන විදුහල්පතිවරුන් සඳහා විනය ක්‍රියාමාර්ග ගැනීමට සිදු වන බව ද වැඩිදුරටත් දන්වමි.

සුජානි ආර්. විජේතුංග
ලේකම්
අධ්‍යාපන තොරතුරු තාක්ෂණ සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
සබරගමුව පළාත් සභාව
... රත්නපුර

සුජානි ආර්. විජේතුංග,
ලේකම්,
අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

පිටපත් :-
01. ආණ්ඩුකාර ලේකම් - දැ.ගැ.ස.
02. ප්‍රධාන ලේකම් - දැ.ගැ.ස.
03. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.ගැ.ස.
04. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.ගැ.ස.
05. කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ - දැ.ගැ.ස. සහ විදුහල්පති වරුන් වෙත මෙම චක්‍රලේඛය ලබා දීම සඳහා